# පුරප්පාඩු

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2025.09.22** දින සිට **2025.10.06** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

### පුහුණුවන තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය 'ආ' ඛණ්ඩය

**සුදුසුකම්:-**

1. අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවක් යටතේ එක් වරකදී විෂයන් තුනක් (03) සමත් විය යුතුය. විෂය සංයෝජනය අධ්‍යයනාංශයේ නිර්දේශය මත අදාළ පීඨය විසින් තීරණය කරනු ලබයි.

සහ

2. තනතුරට අදාල අවම වශයෙන් වසරක පූර්ණකාලීන පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම. මෙම තනතුර සඳහා පුහුණු පාඨමාලාව හෝ ඒ හා සමාන සුදුසුකම අදාල පීඨයේ පිළිගැනීම මත තීරණය වේ.

**වැටුප් පරිමාණය :- රු. 51,095-7×540; 10×640- 60,575 (මාසික) U-MT 1(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වයස** :- අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

### තාක්ෂණික නිලධාරී (විදුලි) III ශ්‍රේණිය

**සුදුසුකම් :-**

1. අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

2. විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 5 වන මට්ටම (V.Q. Level 5) හෝ ඊට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

(Having obtained a certificate of proficiency not below than the N.V.Q Level 5 issued by a Technical / Vocational Training Institute accepted by the Tertiary and Vocational Education Commission or a recognized Institution in the field of Electrical Engineering/ or Equivalent.)

**සටහන :-** පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 51,095-7×540; 10×640- 60,575 (මාසික) U-MT 1(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස** :- අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

### තාක්ෂණික නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණිය

**සුදුසුකම්:-**

1. අ .පො. ස. (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

2. යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම (N.V.Q.) 5 වන මට්ටම හෝ ඊට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

(Having obtained a certificate of proficiency not below than the N.V.Q Level 5 issued by a Technical / Vocational Training Institute accepted by the Tertiary and Vocational Education Commission or a recognized Institution in the field of Mechanical Engineering/ or Equivalent.)

**සටහන :-** පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 51,095-7×540; 10×640- 60,575 (මාසික) U-MT 1(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස** :- අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

### වැද්දුම්කරු (III ශ්‍රේණිය) / පෑස්සුම්කරු (III ශ්‍රේණිය) / යාන්ත්‍රික ශිල්පී (III ශ්‍රේණිය)

1. ඉහත එක් එක් තනතුරුවල කාර්යයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :- රු. 48,005 – 16×490 – 55,845 (මාසික) U-PL 3(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස** :- අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

### පුස්තකාල සහායක III ශ්‍රේණිය

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයක් (06) අවමය සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව උපරිම වාර දෙකක දී සමත් වී තිබීම..

**වෙනත්:**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප්** :- රු. **42,775-16×450 – 49,975 (මාසික) U-PL 1(III)**

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස** :- අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**සටහන :** අයදුම්කරුවන් තම ඉපයීම් වලින් 10%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම් වලින් 15%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට හා 8%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ. එයට අමතරව 3%ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

අයදුම්පත් මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය (Online Portal) **2025.09.22** දින පෙ.ව. 08.30 සිට **2025.10.06 දින ප.ව. 4.30** දක්වා විවෘතව පවතිනු ඇත. වැඩි විස්තර https://www.sjp.ac.lk/vacancies වෙබ් පිටුව මගින් ලබා ගත හැකි අතර මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://hrms.sjp.ac.lk/vacancies/nonacademic/open වෙත පිවිසිය යුතුය.

**Apply Now!**

අයදුම් කරනු ලබන තනතුරට තේරීපත්වුවහොත් අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් ලිපියක් අයදුම්පත සමඟ උඩුගත (Upload) කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පලපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතික වල ඡායා පිටපත් අමුණා නොතිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. යම් තනතුරක් සඳහා අයදුම්පත් විශාල සංඛ්‍යාවක් ලැබුණු අවස්ථාවක අවස්ථාවෝචිත ක්‍රමයක් අනුගමනය කරමින් අයදුම්කරුවන් සීමා කිරීමක් සිදු වේ.

කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ.

**ලේඛකාධිකාරී,**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.
2025.09.18